# යුතුකම

නිල් අහස් වියන යට
සොබා දම් මෑණියන් අපට දායාද කළ
මේ හරිත දනව්වේ
හිරු එළිය පැහැදිලිය
දිය දහර සිසිලැල්ය
පවන් රොද මනලොල්ය
කුරුළු හඬ පවා
පැහැදුල්ය - මනකල්ය
ඈත අප මීමුතුන්
මෙබිම අස්වද්දලා
අභිමනින් නෙලාගත්
වීකරල, එළවළුව, කුරක්කන්, ඉරිඟුවෙන්
ගත සවිය සිත දිරිය
මනාකොට උරාගෙන
එක රැහෙන් බැඳීගෙන
දැය සමය බබුළුවා
අනාගත පරපුරට කළ මෙහෙය බොහෝමය
ඒත් අද. . . ?
නිවට වූ ලක් දනන්
ලෝකයට දෑත පා
යදින්නන් වී සිටී
සරු පොළව අතැර දා
අලස වී දීන වී
රුපියල්ම සොය සොයා
එක රටක - එක දැයක
දනන් ලෙස එකමුතුව
එකිනෙකා ගැන සිතා
පෙර සේම - අපේ දේ අප වවා
සුඛිත වූ - මුදිත වූ
අනාගතයක් කරා
යොමු කළොත් දූ පුතුන්
එයමැ වේ - පරම වූ යුතුකම
අපෙන් විය යුතුම වූ . . .

පිලවල මැණිකේ රත්නායක
''රුවන්'' හීනටිකුඹුර, පිලවල